# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/40 - 2018 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2018.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1998(x)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගතකොට ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක පී. වී. 4833 දරන, නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2016 ජූලි මස 14 වැනි දින අංක 1975/48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ I තීරයේ දැක්වෙන "ගිණුම්කරණය සහ මුදල් කළමනාකරණය ගෞරව" යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසියට යටත් ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ''පරිගණක පද්ධති ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය'' සම්බන්ධයෙන් වූ උපාධි වැඩසටහන සඳහා සිසුන් ඇතුළත් කරගැනීමේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා ධාරාවෙන් 's' සාමාර්ථ තුනක් (03) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් තිබීම යන්නට අනුකූල විය යුතු ය :-

*II වන උපලේඛනය*

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම* |
|---|---|
| පරිගණක පද්ධති ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ගෞරව. | බී එස් සී ගෞරව (පරිගණක පද්ධති ඉංජිනේරු) |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2018 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

01 - 743

1A - PG 3868 — 507 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*